# වීදියේ සොඳුරු සටන්කරුවා

***ගාමිණි හත්තොටුවේගම ශූරීන් අභාවප්‍රාප්ත වී වසර දෙකක් පිරීම නිමිත්තෙනි***





ගාමිණි කල්‍යාණදර්ශ හත්තොටුවේගම වර්ෂ 1938 නොවැම්බර් 29 වැනි දින ගාල්ලේ කුඹල්වැල්ල ගමේ උපත ලැබුවේ සොයුරු සොයුරියන් අට දෙනෙකුගෙන් යුතු පවුලකය. ඔහුගේ පියා කොළඹ නගර සභාවේ සේවය කළ ඉංග්‍රීසි බස මනාව හැසිර වූ උගතෙකු විය. ගාල්ලේ රිච්මන් විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ඔහු බාලකාලයේ සිට සිය පවුලෙන් ලැබූ අභාෂය නිසාදෝ ඉංග්‍රීසි බස අලංකාරව හැසිර වූ බව සමකාලීන මිතුරෝ පවසති.

වර්ෂ 1956 පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ ඔහු නාට්‍ය ක්ෂේත්‍රය පිළිබඳ වඩාත් අවධානයෙන් තම ඉංග්‍රීසි භාෂා විශේෂවේදී ගෞරව උපාධි අපේක්ෂකයකු වශයෙන් ශේක්ෂ්පියර් හා යුරෝපීය නාට්‍ය සම්ප්‍රදායන් පිළිබඳ විශේෂ විමර්ශනයක යෙදිනි. පේරාදෙණිය සරසවියේදී නිෂ්පාදනය වනු සිංහල නාට්‍යයක ප්‍රථම වරට රඟපාන ලද ඉංග්‍රීසි ගෞරව උපාධි අපේක්ෂකයා හත්තොටුවේගම වීම විශේෂත්වයකි.

ඔහු සමඟ සිටි සමකාලීනයන් මෙන් උසස් තනතුරු හා තත්ත්වයන් කරා හඹායෑමේ මානසික අවේගයක් නොතිබූ මෙතුමා සාමාන්‍ය මිනිසකුගේ දිවි පැවැත්ම අගය කළ මානව භක්තිකයෙක් විය. ඔහු සතු ධනය වූයේ අසාමාන්‍ය නව චින්තානුත් සමාජානුයෝගී බවත්, කිසි භේදයකින් තොර සමාජ සිතිවිලිත් පමණි.

රුසියානු මහා ගත්කරු ඇන්ටන් චෙකොෆ්ගේ "ප්‍රොපෝසල්" නමැති නාට්‍ය වර්ෂ 1961 දී "මඟුල් පරස්තාව" නමින් නැවත එළිදක්වන ලද්දේ මෙතුමාය.

ඉංග්‍රීසි භාෂාව ගෞරව උපාධිය ලබා වර්ෂ 1960 ගණන් වලදී පමණ නැවතත් තමා උගත් පාසල වන ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලය කරා පියනැගූ ඔහු වසර 04 ක් එහි ගුරුවරයකු වශයෙන් ගත කළ කාල පරිච්ඡේදය තුළ එහි සිසුන් සමඟ ඉංග්‍රීසි හා සිංහල මාධ්‍ය පාසල් නාට්‍ය රැසක් නිෂ්පාදනය කරන ලදී.

වර්ෂ 1964 දී පමණ අප විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට (වත්මන් කැලණිය සරසවිය) ඇතුළත්ව සුවිශේෂී පෞරුෂයකින් හෙබි මෙම අසිරිමත් පුද්ගලයා සරසවි භූමියේ සැරිසරණු දුටුවේ හදිසියේ ප්‍රමාද වී නාට්‍ය රඟ දැක්වීමක් සඳහා නාට්‍යාගාරයකට වේගයෙන් හා ඇතින් පියවර මනින ප්‍රධාන නළුවකු මෙනි. අන් කිසිවෙකුට උරුම නොවූ ඔහුගේ මුහුණෙන් ප්‍රදර්ශනය වූ තීක්ෂණ හැඩතල එක්වරක මම දුටුවේ සම්භාවය යුරෝපීය නළුවන් සියල්ලන්ගේම සම්මිශ්‍රණය වූ ශරීර භාෂාවකි.

ඒ වන විට මෙතුමා දළුගම විශ්වවිද්‍යාල මණ්ඩලයේ ඉංග්‍රීසි අංශයේ සේවය කළත්, නාට්‍ය ක්ෂේත්‍රය පමණක් නොව, සරසවි ක්‍රිකට් කණ්ඩායමේ භාරකාර ආචාර්යතුමා ලෙස තම ශ්‍රමයත් තමා සතු අල්ප ධනයත් වැය කළේ අසාමාන්‍ය ධන කුවේරයකු මෙන් නිර්ලෝභීවය.

වර්ෂ 1966 දී විදුලකර, විදුදය සරසවි මහා ක්‍රිකට් ගැටුමේදී විදුලකර සරසවිය ළඟා කරගත් ක්‍රීඩා සටන්කාමී ගෞරවයේ ප්‍රධාන දායකත්වය මොහු සතු වේ. 1967 (ඒබේ කඳකකැටැ) යාපනය විද්‍යාලය සමඟ කළ ක්‍රිකට් සටන් ඩේලිනිවුස් ටුරූපි ක්‍රිකට් සටන් සදා අමතක නොවේ. ඒ අතර ජැෆිනා කොලීජියේ ආචාර්ය මණ්ඩලය හා මහා ශිෂ්‍ය සංගමය අමතා මෙතුමා කළ නාට්‍ය පිළිබඳ විශේෂ දේශනය දෙමළ උගතුන්ගේ මවිතයට හා ආශ්වාදයට හේතු වූ බව දේශනය අවසානයේ පෙරළා ලැබුණු මහා අත්පොළසන් නාදයෙන් පසක් විය.

මෙම වර්ෂයේම කැළණි විශ්වවිද්‍යාල දළුගම මණ්ඩපයේ ප්‍රථම කළා උළෙල නාට්‍ය තරගයට පෙරවදනක් සපයමින් සිසුන් කීපදෙනෙකු එක්රැස් කරගෙන ඨණ සර්

කොබෙයි රැලක් රංචු ගසා නගින්නේ .....//<br>
නිල් අහස හඹා යන පිළිහුඩුවා ....//<br>
වනයේ ගිරවා හොට රතු කෙරුවා//<br>
කොබෙයි රැලක්

යන නාට්‍යෝචිත කෙටි පිවිසුම අවසන් වන විට

**සුනිල් අබේසේකර**
ආදි විද්‍යාර්ථී - කැළණිය විශ්වවිද්‍යාලය

මහා සිසු කැළ අත්පොළසන් දෙමින් ගෞරව පළ කළ සැටි අදම අද මෙන් මාගේ මතකයට නැගේ. එතුමාගේ වීදි නාට්‍යවල මුලාරම්භක පිවිසුම, ආරම්භක අවස්ථාව මෙය බව ඊට සහභාගි වූ මා සමඟ එතුමා කීප වරක්ම පවසා තිබේ.

මේ අවදියේ (1960 දශකයේ) පුවත්පත් කලාවේදී හා චිත්‍රපට විචාරකයන්ගේ සංගමයේ ප්‍රබල මුලාරම්භක සාමාජිකයන් වන තිස්ස අබේසේකර, නාමෙල් වීරමුනි සහ තවත් අතලොස්සක් අතර මුලාරම්භක සභාපති වශයෙන් ජී. කේ. සර් එදා රීගල් සිනමා ශාලාවේදී සම්භාව්‍ය චිත්‍රපට උළෙලක් සංවිධානය කිරීම ලෙහෙසි පහසු කර්තව්‍යයක් නොවීය.

මා වර්ෂ 1973 දී පමණ අනුරාධපුර ශාන්ත ජෝසප් විදුහලේ සේවය කරන අවදියේ ජී. කේ. සර් පරාක්‍රම නිරිඇල්ලයන්ගේ කළමනාකාරිත්වයෙ-න් එච්. ඒ. පෙරේරා, දීපානි සිල්වා, හෙට්ටිආරච්චි පියරත්න අදිකාරී යන කණ්ඩායමකගේ සහභාගීත්වයෙන් පොසොන් පුන් පෝ දිනක සඳ එළියේ අනුරාධපුර හරිස්චන්ද්‍ර ක්‍රීඩා පිටියේ සහ ජනාකීර්ණ අනුරපුර දුම්රියපළේ රඟ දැක්වූ විදි නාට්‍ය සංදර්ශන ආරම්භක වීදි නාට්‍ය සංදර්ශන ලෙස ඉතිහාසයේ සනිටුහන් වී ඇත. එදා වේදිකා ගත වූ "මිනිසකුට එල්ලිලා මැරෙන්න බැරිද" යන ප්‍රහසනාත්මක කෙටි නාට්‍ය කණ්ඩය විවිධ පොදු ජන මහා ප්‍රෙක්ෂක කැළ අතර අතිශය ජනප්‍රියත්වයට පත් විය.

පසු භාගයේ වේදිකා හා ටෙලි නාට්‍ය සමඟ චිත්‍රපටවල දීප්තිමත් තරු බවට පත් වූ ශිල්පීන් රාශියකගේ මුලාරම්භක ශිල්ප ශාලිකාව වූයේ හත්තොටුවේගම සර්ගේ ප්‍රායෝගික නාට්‍ය වැඩමුළු හා වීදි නාට්‍ය රංග කලාවයි. ඊට පසු රංග කැබලි, සංගීත, සොච්චම ... යනාදී වීදි නාට්‍ය අංග මේ ක්ෂේත්‍රය පෝෂණය වීමට බෙහෙවින් බලපාන ලදී. මහා කවි විලියම් ශේක්ස්පියර්ගේ "හැම්ලට්" නාට්‍ය පරිවර්තන අතර, හොඳම සිංහල පරිවර්තනය බව විචාරක ප්‍රසංශාව ජී. කේ. සර්ට ලැබුණේ ඊට දායක වූ ලක්ෂ්මන් ප්‍රනාන්දු හා ඊ. ඒ. ජී. ෆොන්සේකා වියතුන්ගේ අනුපමේය සහාය නිසාය.

කාලාන්තරයක් තිස්සේ ගොඩනැගුනු නාට්‍ය විෂයාන්තර ප්‍රතිභාව හත්තොටුවේගම වියතාගෙන් ලබා ගැනීමට විදේශ රටවල් පවා අපේක්ෂා කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1980 සිට ඕස්ට්‍රේලියාව, ජර්මනිය, නෝර්වේ, පිලිපීනය, තායිලන්තය, ඉන්දියාව වැනි රටවල නාට්‍ය වැඩමුළු හා සංදර්ශන පැවැත්වීමෙන් තමාට මෙන්ම තම මව් රටට ද අනපේක්ෂිත අතිමහත් කීර්තියක් ළඟා කර දුන්නේය.

වර්ෂ 1972 දී හොරණ ශ්‍රීපාලි විද්‍යා පීඨයේ සුන්දර ගෙවුයනක පසෙක පිහිටි නිවසක පදිංචිව සිටි හිටපු විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අංශ ප්‍රධානි වියත් ආරියරත්න මැතිතුමාගේ දියණිය වන යමුනා සමඟ විවාහ විය. ඔවුන් දෙදෙනාට රජිත් හා චමිදු යනුවෙන් පුතකු හා දියණියක් බිහිවිය. ඒ අවදියේ හත්තොටුවේගම පවුල වීදි නාටක වෙනුවෙන් කැපවූහ. පසු කලෙක ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලැබූ මෙම දරුවන් පරිගණක ඉංජිනේරුවන් වශයෙන් එරටෙහි සේවය කරති.

වර්ෂ 1974 මහාචාර්ය හල්පේ මහතා පේරාදෙණිය සරසවියේ ඉංග්‍රීසි අංශයේ ප්‍රධානියාව සිටි අවදියේ හත්තොටුවේගම වියතාගේ ශක්තීන් හඳුනාගත් එතුමා මෙම සම්පත් පුද්ගලයාගෙන් ප්‍රයෝජනයට ගනු වස් තම දෙපාර්තමේන්තුවේ ඉංග්‍රීසි අංශයේ කථිකා-චාර්යවරයෙකු ලෙස බඳවා ගන්නා ලදී. ඒ අවදියේදී එතුමා "සිනමා සෞඳර්ය" පිළිබඳ විශ්වවිද්‍යාලය තුළ මෙන්ම විවිධ පරිසරයන්හි සමාජ තලයන්හි දේශන ඇරඹිය. මෙකල පානදුර පිංවත්ත දුම්රිය ස්ථානයේ දුම්රිය ස්ථානාධිපතිගෙන් ලැබුණු සහාය එතුමා මා සමඟ නිතර පවසා තිබේ.

වර්ෂ 1971 දී සුප්‍රසිද්ධ නාට්‍ය ශිල්පවරයකු වන ධම්ම ජාගොඩ ශූරීන් කොළඹ ලයනල් වෙන්ඩ්හි ශිල්ප ශාලිකාවේ ඇරඹූ ප්‍රායෝගික නාට්‍ය වැඩමුළුවල ප්‍රධාන සහායක ගුරුවරයකු වශයෙන් ජී. කේ. ගුරුතුමා උනන්දුවෙන් සහභාගී විය. ශ්‍රී ලංකා කලා සංගමයෙන් පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළෙලේ වීදි නාට්‍ය විෂය ක්ෂේත්‍රයට කළ සේවය වෙනුවෙන් මෙතුමාව රාජ්‍ය සම්මානයෙන් පුදනු ලැබීය. වර්ෂ 2007 දී ජාතික නාට්‍ය උළෙලේ ගුරු වෘත්තිකයකු, විචාරයකු, නාට්‍යවේදියකු, නළුවකු, ඉංග්‍රීසි හා සිංහල ද්වි භාෂා මාධ්‍ය නාට්‍ය අධ්‍යක්ෂවරයකු ලෙස කළ මහඟු සේවාවට එතුමා ගෞරව සම්මානයෙන් පුදනු ලැබීය.

විශ්වවිද්‍යාලයක විද්‍යාර්ථියෙකු, දස දහස් සංඛ්‍යාවක් ගෝල බාලයන් බිහි කළ ගුරුවරයකු, පරිවර්තකයෙකු, අනුවර්තකයකු, නාට්‍යවේදියකු, මාධ්‍යවේදියකු ද්විභාෂා මාධ්‍ය විචාරකයකු, මානව හිතවාදියකු වශයෙන් අඩසිය වසකටත් වඩා රටට ජාතියට එතුමා කළ කැපවීම වෙනුවෙන් කැලණිය විශ්වවිද්‍යාලය විසින් පැවැත්වූ උපාධියෙන් පුදනු ලැබීම කොපමණ අගය කළ යුත්තක් ද, කෘතගුණ සැලකීමක් ද? මේ පිළිබඳව විදුලකර සරසවියේ මේ අන්දමට ගෙවී ගිය ස්වර්ණමය යුගයේ සිටි ජ්‍යෙෂ්ඨයන් හා වත්මන් පාලක මණ්ඩලය මෙතුමා මිය යන්නට පෙර කෘතගුණ සැලකීම මහා සත්පුරුෂ කමකි.

"මිනිසාගේ තනතුරු, බලතල, වත්කම්, ඉවත් කළ පසු ඔහු තුළ සිටින්නේ සාමාන්‍ය මිනිසකු පමණි යන සුප්‍රසිද්ධ කියමනට අනුරූපීව ගාමිණී හත්තොටුවේගම ගුරුපියාණන් තම ශේෂ වූ ආයු කාලය තුළ ඉහත සඳහන් සියලු චංචල ආභරණ පසෙක ලා සාමාන්‍ය මිනිසකු වශයෙන් තම දිවිය ගෙවා අප සැමගෙන් වියෝවීම ශෝකජනකය. ශ්‍රී ලංකාද්වීපයට වීදි නාට්‍ය හඳුන්වා දුන් එය සංස්කෘතික අංගයක් බවට පත් කිරීමට වෙර දැරූ අපේ ගුරුතුමාට නිවන් සුව අත්වේවා. !!

**දෙමව්පියනි**

අපේ උරුමය භාෂාව හා සංස්කෘතිය ඔබේ දරුවාගේ මනසින් ගිලිහී නොයා රැක ගැනීම ඔබේ වගකීමක් නොවේ ද?
පාරමිතා බෞද්ධ විහාරස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන සිංහල භාෂා පාසලට ඔබේ දරුවා ඇතුලත් කරන්න.

දරුවාගේ මනස පිනවන මාසික විවිධ ප්‍රසංග නාට්‍ය කවි ගීත වැනි විවිධ ක්‍රියාකාරකම් මගින් අපේ මව් බස ඔබේ දරුවාට ළඟා කිරීම අපේ වෑයමයි.
එය ඔබේ දරුවාට ප්‍රියජනක අද්දැකීමක් වන බව වසර ගණනාවක අපේ පළපුරුද්ද පෙන්වා දෙයි.

2012 වසර සඳහා සිසුන් බඳවා ගැනීම පෙබරවාරි 5 සිට ඇරඹෙයි.

**Taylors Lakes Secondary School**
39 Parmelia Dr Taylors Lakes 3038 (Melway 13J3)

**විමසීම්**
විහාරස්ථානය 03 9747 1902
බණ්ඩාරනායක (සංවිධායක) 0425 855621